# මධ්‍ය යාන්ඔය නිම්නයේ වාරි පුරාවිද්‍යාව




යාන් ඔය නිම්නයේ භෞතික පිහිටීම


N
10
5
0
10 Km




මධ්‍ය යාන්ඔය නිම්නයේ යාන්ඔය හා වැව් පද්ධතියේ පිහිටීම




මධ්‍ය යාන් ඔය නිම්නයේ වාරි කර්මාන්තවල සිතියම




අධ්‍යයන ප්‍රදේශයේ යාන් ඔය සහ වාරි පද්ධතියේ සිතියම




අධ්‍යයන ප්‍රදේශයේ පුරාවිද්‍යා ස්ථාන හා වාරි පද්ධතියේ ස්ථානගතවීම දැක්වෙන සිතියම

# මධ්‍ය යාන්ඔය නිම්නයේ වාරි පුරාවිද්‍යාව

චන්දන රෝහණ විතානාච්චි

## හැඳින්වීම

යාන්ඔය නිම්නය ආශ්‍රිත පුරාණ වාරිමාර්ග පිළිබඳ ව සිදුකරනු ලැබූ ක්ෂේත්‍ර ගවේෂණ කටයුතුවලින් අනාවරණයකර ගත් තොරතුරු පිළිබඳ ව සංක්ෂිප්ත තොරතුරු වාර්තාකිරීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වේ. යාන්ඔය හා එහි අතු ගංගා අධ්‍යයනයට ලක් වූ ප්‍රධාන ජල මාර්ග වේ. මෙම පර්යේෂණය තුළ යාන්ඔය නිම්නය ආශ්‍රිත පුරාණ වාරි මාර්ග පිළිබඳ ව කරුණු ඉදිරිපත් කිරීමට ගංගා නිම්නයේ භෞතික ස්වභාවය, ඓතිහාසික ජනාවාසකරණය සහ වාරි මාර්ගික පසුබිම පිළිබඳ සංක්ෂිප්ත පැහැදිලි කිරීමක් මෙ මඟින් සිදුකර තිබේ.

## භෞතික ස්වභාවය

මාතලේ කඳුවැටිවල ඊසාන දිග පහළ බෑවුම් ප්‍රදේශයෙන් ආරම්භවන යාන්ඔය කි.මී. 151 (සැතපුම් 94) ක පමණ දිගකින් යුක්ත ගංගාවක් වේ. සීගිරියට බටහිර දෙසින් හා රිටිගලට නැගෙනහිර දෙසින් ගලාබසින යාන්ඔයේ ඉහළ භාගය හඳුන්වනු ලබන්නේ හබරන ඔය ලෙසිනි. හබරන, ගලෙන්බිඳුණුවැව, කහටගස්දිගිළිය, හොරොව්පොතාන වැනි ප්‍රදේශවලට තරමක් ආසන්නයෙන් ගමන්කරන යාන්ඔය පුල්මුඩේට දකුණු දෙසින් හා ත්‍රිකුණාමලයට සැතපුම් 48 ක් උතුරු දෙසින් සාගරයට එකතු වේ (Arumugam 1969: 269).

යාන්ඔය නිම්නය ප්‍රධාන වශයෙන් අයත් වන්නේ වියළි කලාපයට ය. එයට වර්ග කි.මී. 1520 ක (වර්ග සැතපුම් 594) ප්‍රමාණයක පැතිරුණු පෝෂක ප්‍රදේශයක් හිමිවේ. හබරන ඔය මඟින් යාන්ඔය ට සාමාන්‍ය මට්ටමේ ජල ප්‍රමාණයක් වර්ෂය පුරා ම එකතුකරන මුත් ඊට පහළින් සම්බන්ධවන ජල මාර්ග ප්‍රධාන වශයෙන් සක්‍රිය වන්නේ ඊසාන දිග මෝසම් වර්ෂා කාලයේ දී පමණි.

වර්ෂයකට ඝන මීටර් මිලියන 2269 (අක්කර අඩි 636000) ක පමණ වැසි ජල ප්‍රමාණයක් මෙම පෝෂක ප්‍රදේශයට ලැබෙන අතර ඉන් ඝන මීටර් මිලියන 300 ක් හෙවත් සියයට 19 (19%) ක ජල ප්‍රතිශතයක් වාර්ෂික ව මුහුදට එකතුවේ (එම.: 4).

පටු දිගටි ස්වරූපයක් ගන්නා යාන්ඔය නිම්නය ප්‍රධාන වශයෙන් පාංශු කලාප දෙකකට අයත් වේ. ඉහළ යාන්ඔය නිම්නය පුරා දක්නට ලැබෙන්නේ රතු-දුඹුරු පසවන අතර පහළ කොටසේ ගං දැලෙහි ප්‍රධාන වශයෙන් රෙගසෝල් හා දියළු පස් සහිත කලාපය දක්නට ලැබේ (*ලආසි* :24).

## ඓතිහාසික ජනාවාස වීම

වංසකතා හා ශිලා ලේඛන මූලාශ්‍රයන් මඟින් හෙළිවන තොරතුරු අනුව පුරාතන ජනාවාසකරණය සම්බන්ධයෙන් වැදගත් වූ ගංගා නිම්නයක් ලෙස **යාන්ඔය නිම්නය** හැඳින්විය හැකි ය. මූල (Proto) ඓතිහාසික අවධියේ ජනාවාසකරණය සම්බන්ධයෙන්වන සාක්ෂි මෙම නිම්නයේ ස්ථාන කිහිපයකින් ම අනාවරණයකර ගෙන තිබේ. එම අවධියට අයත් යැයි අනුමානකල හැකි ඉපැරණි සුසාන භූමිවල වැඩි ම ව්‍යාප්තිය දක්නට ලැබෙන්නේ ද මෙම නිම්නයේ ය. ගුරුගල්හින්න, කොක්එබේ, වඩිගවැව, දිවුල්වැව හා තම්මැන්නාගොඩැල්ල ඇතුළු ප්‍රදේශ ගණනාවකින් මෙ වැනි සුසාන භූමි අනාවරණයකර ගෙන තිබේ

(Senaviratne 1984: 237-95). මෙම සුසාන භූමි අවට පරිශ්‍රයන් පරීක්ෂා කිරීමේ දී ඊට තදාශ්‍රිත ව පැවති ජනාවාස ස්ථාන සම්බන්ධයෙන් ද අදහසක් ලබාගත හැකි ය. මෙම නිම්නයේ පිහිටි ස්ථාන රැසකින් ක්‍රිස්තු පූර්ව 2 - 1 කාලයට අයත් පූර්ව බ්‍රාහ්මී ලෙන් ලිපි රැසක් හමුවී තිබේ. රස්නකවැව, හඳගල, මහකපුගොල්ලෑව, වලස්කුනුවැව, කුඩා අඹගස්වැව, අලියාකඩ, වාගොල්ලාකඩ, බෙරවාගම, මැදගමකන්ද, බ්‍රාහ්මණයාගම, කොක්එබේ, වදකහගලහින්න, පුලියන්කඩවල, දියතිත්තවැව, සීගිරිය, පිදුරංගල වැනි ස්ථානවලින් එම ලිපි හමුවී ඇත (*Ic.* Vol. i: Nos.115-165, 866-874). හමුවී තිබෙන අපර බ්‍රාහ්මී සෙල්ලිපි මඟින් මෙම නිම්නය ආශ්‍රිත ව ජනාවාස ක්‍රමයෙන් ව්‍යාප්තවීම පිළිබඳ ව අදහසක් ලබාගත හැකි ය (*එම:* Vol. i: Nos.1125-1140; Vol.ii: 61, 62, 63, 65, 73, 81, 82, 83, 115, 145, 147, 153, 154).මෙම ලිපිවල සඳහන්වන ග්‍රාම නාම, දිසා නාම සහ වාරි නාම ආදිය මඟින් ස්ථාවර ජනාවාස බිහිවීම සම්බන්ධයෙන් තොරතුරු අනාවරණයකර ගත හැකි ය.

පුරාණ **ගෝකණ්ණයේ** සිට අනුරාධපුරය වෙත ගමන්කල නැගෙනහිර මාර්ගය (සිරිවීර 2002: 167) යාන්ඔය ආශ්‍රිත ව සැලකිය යුතු දුරක් ගමන්කර තිබුණු බව පුරාවිද්‍යාත්මක සාධක අනුව පැහැදිලි වේ. ඒ බව සනාථ කෙරෙන පුරාණ මාර්ගයේ තිබුණු ගල්පාලම් කිහිපයක අවශේෂ යාන්ඔය ආශ්‍රිත ව පවතින ආකාරය අපගේ නිරීක්ෂණයට ලක්විය. මෙම ගල්පාලම්, කරත්ත, ගැල් ආදිය ගමන්කිරීම තරම් විශාලත්වයෙන් පැවති බව එම නටබුන් ඇසුරින් නිගමනය කිරීමට පුළුවන. මෙම මාර්ගය ඔස්සේ ගෝකණ්ණ වරායේ සිට භාණ්ඩ පමණක් නොව නැගෙනහිර පළාතෙන් සපයාගත හැකි ඛනිජ ද්‍රව්‍ය හා එම නිෂ්පාදන ද අනුරාධපුරය වෙත ප්‍රවාහනය කරන්නට ඇත. සේරුවිල තඹ නිධිය භාවිතයට ගත් බවට දැක්වෙන තොරතුරු මඟින් ඒ පිළිබඳ ව අදහසක් ලබාගත හැකි ය (*මව.* xxviii: 16-7; Senaviratne 1994: 114-146). යාන්ඔය නිම්නය ආශ්‍රිත ව එම ලෝහ වර්ග භාවිතකල ශිල්පීන්ගේ ජනාවාස පැවති බව බ්‍රාහ්මණයාගම වැනි ලිපි මඟින් අනාවරණයකර ගැනීමට පුළුවන (*Ic.* Vol. i: No.161d). එම ලිපිවල ලෝහ කාර්මික ශිල්පීන් **තබර, කබර** වැනි නාමයන්ගෙන් හඳුන්වා තිබේ. දුටුගැමුණු රාජ්‍ය සමයේ මැණික් ලැබුණු බවට මහාවංසයේ සඳහන්වන **සුමනවාපි** හෙවත් සමන්වැව (*මව.* xxviii: 18) යාන්ඔය ඉහත්තාවේ හබරණ ප්‍රදේශයේ පිහිටා තිබූ බව නිකලස් පවසා සිටී (Nicholas 1963: 173).

ක්‍රිස්තු පූර්ව පළමු වැනි සහ ක්‍රිස්තු වර්ෂ පළමු වැනි සියවස් අතර කාලයවන විට යාන්ඔය නිම්නයේ ඇතැම් ප්‍රදේශ දිසාවන් ලෙස වර්ධනය වී තිබුණු බව සෙල්ලිපි ඇසුරින් අනාවරණයකර ගත හැකි ය. පළමු වැනි ගජබාහු (ක්‍රි.ව.114-136) රජුගේ පාලුමැකිච්චාව සෙල්ලිපියේ සඳහන් **උපලවිබිජක** එ වැනි දිසාවකි (*Ez.* Vol. i: No.18). **උපලබිජක** නමින් ද ව්‍යවහාර වූ එම දිසාවේ **පජින නකපවත වෙහෙර** නමින් විහාරයක් විය (එම. Vol. ii: No.140). තම්මැන්නාකන්ද ලිපිවල **පටගම, නවගම, කුඩවනගම** නම් ප්‍රදේශ නාම සඳහන් ව තිබේ (*Ic.* Vol. ii: No.140). නැට්වුක්කන්ද ලිපියේ සඳහන්වන **එරකපි ග්‍රාමය** (*එම.* Vol. i: No.168) යාන්ඔය නිම්නයේ පිහිටා ඇත. **හොනගිරි විහාරය** පිහිටා ඇත්තේ ද එම ප්‍රදේශයේ විය හැකි ය (*එම.* Vol. ii: No.141a,c). එම ලිපි සමහරක සඳහන්වන **කුබරගම** හෙවත් **කබරගම** යකඩ ලෝහය භාවිතකල ශිල්පීන්ගේ ග්‍රාමයක් ලෙස සැලකිය හැකි වේ. වේවැල්කැටිය සෙල්ලිපියේ යාන්ඔය නිම්නයේ පිහිටි **අම්ගම්කුළිය** නම් උප

දිසාවක් පිළිබඳ ව ද තොරතුරු සඳහන් වේ (*Ez*. Vol. i: No.21). වේවැල්කැටිය ලිපියේ **කිබිගම** නම් ගමක පිහිටි **දෙමළවෙහෙර** නම් විහාරයක් පිළිබඳ ව සඳහන් ව ඇති අතර කිරිගල්ලෑව ලිපියේ අම්ගම්කුළියේ පිහිටි **ඉත්නරුගම** නම් ප්‍රදේශය පිළිබඳ සඳහන් ව තිබේ (*Ic*. Vol. v: No.40. 7).

හඳගල විහාර ලිපියක **මතලගම** නම් වූ ප්‍රදේශ නාමයක් සඳහන් ව ඇත (එම. Vol. i: No.128). ලබුඇටබැදිගල ලිපිවල **නිමලවිටිය** නම් ගමක් පිළිබඳ ව සඳහන් වේ (*Ez*. Vol. iii: No.26). **තුබඩ-වසක** නම් ග්‍රාම ශ්‍රේණියක් පිළිබඳ ව මහ කපුගොල්ලෑව ශිලා ලේඛනයක සඳහන් ව ඇත (*Ic*. Vol. i: No.135). වෙහෙරබැඳිගල නම් ස්ථානයේ තිබෙන ලිපියක **හිදනගම** යන ප්‍රදේශය පිළිබඳ සඳහන් ව ඇත (නිකලස් 1979:198). හොරොව්පොතාන ආසන්න ප්‍රදේශයේ තිබෙන **රස්නකවැව** පිහිටි සෙල්ලිපි ගණනාවක **දහණකර**, **තොජනහින**, **අබදවරනය ගම**, **තබත**, **පළවස**, **අබලවස**, **පෙකරවස** යන ප්‍රදේශ පිළිබඳ ව සඳහන් ව ඇත (*Ic*. Vol. ii: No.153). යාන්ඔය නිම්නයේ පහළ තම්මැන්නාව ගිරිලිපියේ **මජ්මගම**, **අබලකුබර**, **පකරවස**, **දුබලකුබර**, **පහණකුබර**, **රච්ටවිණි**, **ජබුකුඹුර**, **මනගම** නමින් වූ කුඹුරු පිළිබඳ ව සඳහන් ව තිබේ (එම.: No.82).

යාන්ඔය නිම්නයේ බඹරහෙල ලෙන් ලිපියක සඳහන්වන **දනතකගම** එම ප්‍රදේශයේ පැවති පුරාණ ජනාවාසයකි (එම. Vol. i: No.178). පළමු වැනි ගජබාහු රජුගේ තාමරගල ගිරි ලිපියේ යාන්ඔය නිම්නයේ පිහිටි **ගුත්තපබ්බත** නමින් විහාරයක් පිළිබඳ ව ද, **හජිය**, **මරඩිකුඹුර**, **චුලවික**, **දනකරක කුබර**, **උතර අරක**, **පනදතමහ කුබර**, **කරබෙක**, **සිවවක** ආදී නමින්වන කෙත් බිම් රාශියක් පිළිබඳ ව දක්වා ඇත (එම. Vol. ii: No.63). ගජබාහු රජුගේ විලේවැව ගිරි ලිපියේ ද **කුබරගම** යන්න සඳහන් ව ඇත (එම: No. 65). එම ග්‍රාමය ද යකඩ ලෝහය භාවිතකල ශිල්පීන්ගේ ග්‍රාමයක් ලෙස උපකල්පනයකල හැකි වේ. කොක්එබේ වදකහගලහින්න පිහිටි අපර බ්‍රාහ්මී ලිපියක **හුමනජ......න ලොකෙය** යනුවෙන් සඳහන්වන අතර එය ප්‍රදේශ නාමයක් ලෙස අනුමානකල හැකි ය (එම. Vol. i: No.1146). යාන්ඔය අසල ම පිහිටි කොක්එබේ කන්දේ පිහිටි ගිරි ලිපියක "**මහගම**" ප්‍රදේශය පාලනයකල ආර්යයෙකු පිළිබඳ ව හා **හරයඩ** නම් විහාරයක් හා එයට ඇඳන ලද කුඹුරු කිහිපයක් පිළිබඳවත් සඳහන් ව තිබේ (එම. Vol. ii: No.81). කිරලාගල ගිරි ලිපියේ **බොතිගම**, **දිගසිවගම**, **දඩමකුල**, **කබරජිතගම** නම් ප්‍රදේශ පිළිබඳ ව දැක්වේ (එම.: No.145).

මහල්ලකනාග රජුගේ කාලයට අයත් තිඹිරිවැව ශිලා ලේඛනය සහිත ස්ථානය පිහිටා ඇත්තේ ද යාන්ඔයට සමීප ප්‍රදේශයක ය. එහි **ගඟවි** හි පිහිටි **ගඟ පවත** නම් විහාරයක් පිළිබඳ ව සඳහන් ව ඇත (එම.: No.73). එය යාන්ඔය සමීපයේ පිහිටි බව මෙයින් අර්ථවත්වන බව පැහැදිලි ය. ගෝඨාභය (ක්‍රි.ව. 249-262) රජුගේ කාලයට අයත් ගිරි ලිපියක් ද මෙම ස්ථානයේ තිබෙන අතර එහි ද ගඟවි යනුවෙන් සඳහන් ව ඇත (*Ez*. Vol. iv: No.28). ක්‍රිස්තු වර්ෂ පස් වැනි සියවසවන විට ශ්‍රී ලංකාවේ වැදගත් ස්ථානයක් බවට යාන්ඔය නිම්නයේ පිහිටි **සීගිරිය** පත් ව ඇත (*මව*. xxxix:1-5). රාජධානියක් වශයෙන් ද, රජ මාළිගා හා උද්‍යාන සංකීර්ණයක් වශයෙන් ද සීගිරිය ට හිමි ව තිබෙන ඓතිහාසික වැදගත්කම ඉහළ මට්ටමක පවතී. කෙසේ නමුත් සීගිරිය සහ ඒ අසළ තිබෙන පිදුරංගල ක්‍රිස්තු වර්ෂ ආරම්භයවන විට ආගමික මධ්‍යස්ථානයක් බවට පත් ව තිබෙන බව එම ස්ථානවලින් හමුවී තිබෙන ලෙන් ලිපිවලින් තහවුරු වී තිබේ (*Ic*. Vol. i: Nos.867-74).

සෙල්ලිපි ඇසුරෙන් අනාවරණයකර ගත හැකි ස්ථාන නාම, විහාර ආදිය මඟින් පැහැදිලි වන්නේ දීර්ඝ කාලයක් පුරා යාන්ඔය නිම්නය ජනාවාසකරණයට ලක් වී පැවති බවකි. අනුරාධපුර රාජධානිය පෝෂණයකරන ලද බාහිර පර්යන්තයක් වූ මෙම නිම්නයේ නිෂ්පාදන හා කෘෂි කාර්මික ජනතාවක් වාසය කරන්නට ඇති බව උපකල්පනයකල හැකි වේ. එය මූල ඓතිහාසික අවධියේ සිට ම පැවති ක්‍රියාවලියක් බව හඳුනාගැනීමට පුළුවන. ඒ බව තහවුරුවන සාධකයක් වන්නේ මෙම සෙල්ලිපි ඇසුරින් අනාවරණයකර ගත හැකි පුද්ගල නිලතල නාමයන් ය. එය පරුමකවරුන්ගේ සිට විවිධ ශිල්ප ශ්‍රේණි දක්වා විහිදී ගිය පුළුල් පරාසයකින් යුක්තවන බව හඳුනාගැනීමට පුළුවන.

## වාරි මාර්ගික පසුබිම

යාන්ඔය නිම්නයේ ජනාවාසකරණය සම්බන්ධයෙන් තොරතුරු ලබාගතහැකි තවත් වැදගත් ජීවමාන සාක්ෂියක් වන්නේ එම ප්‍රදේශය පුරා විහිදී තිබෙන විශාල, මධ්‍ය හා කුඩා ප්‍රමාණයේ වාරි නිර්මාණයන් ය. ඇළ මාර්ග හා අමුණු පිළිබඳ සාධක ද මේ අතර පවතී. මෙම නිම්නයේ පැවති වාරි නිර්මාණ රාශියක් පිළිබඳ ව සෙල්ලිපි හා වංසකතා මූලාශ්‍රයවලින් තොරතුරු අනාවරණයකර ගත හැකි ය. යාන්ඔය නිම්නයේ පැරණි වාරි නිර්මාණ පිළිබඳ ව අධ්‍යයනය කිරීමේ දී එම ප්‍රදේශයේ පිහිටි මූල ඓතිහාසික සුසාන භූමි ආසන්නයේ තිබෙන වැව් පිළිබඳ ව ද සැලකිලිමත් වීම වැදගත් වේ. ගුරුගල්හින්න, තම්මැන්නාගොඩැල්ල, වඩිගවැව, කොක්එබේ වැනි සුසාන භූමි ආශ්‍රිත ව පැවති වැව් පිළිබඳ සාක්ෂි වර්තමානයේ ද හඳුනාගැනීමට පුළුවන. බොහෝවිට මෙම වැව් එම ප්‍රදේශ ජනාවාස බවට පත්කරගත් මූල ඓතිහාසික ජනතාව විසින් ඉදිකරන්නට ඇත. ආරම්භයේ දී කුඩා වැව් ලෙස ගොඩනැගුණු මේවා ජනාවාස ව්‍යාප්තවන විට ක්‍රමයෙන් විශාල කරන්නට ඇති බව උපකල්පනයකල හැකි ය.

**පළමු වැනි ගජබාහු** (ක්‍රි.ව. 114-136) රජුගේ පාලුමැකිච්චාව සෙල්ලිපියේ **උපලබිජක දිසාවේ පිහිටි වඩමන වැව** හෙවත් **වඩ්ඩමානක වැව** ප්‍රතිසංස්කරණය කරවූ බව සඳහන් ව තිබේ (*Ez*. Vol. i: No.18). එම රජුගේ කාලයට අයත් තාමරගල ගිරි ලිපියේ **පහනවිය** නම් වූ වැවක් පිළිබඳ ව සඳහන් වේ (*Ic*. Vol. ii: No.63). අම්නිච්චිය සෙල්ලිපියක **පජිනපස** හෙවත් **පාචීන** දේශයේ වූ ඇළ මගක් පිළිබඳවත් **වජියව වැව**, **කදඅවිය වැව**, **වදබලගමක වැව**, **නවඩඅවිය වැව** වශයෙන් වැව් කිහිපයක් පිළිබඳවත් සඳහන් ව ඇත (නිකලස් 1979:200). නැට්ටුක්කන්ද ලිපිවල සඳහන්වන **සදවිය**, **කබරවිය**, **දතවිය**, **සිවලවිය**, **තිසවිය**, **කුඹරගමවිය**, **කබරගමක වවි**, **පජිනි හොනගරිය වවි**, **පඩි වවි** (*Ic*. Vol. ii: No.141a-c) යන වැව් යාන්ඔය නිම්නයේ පිහිටා තිබෙන්නට ඇත. හඳගල විහාර සෙල්ලිපිවල සඳහන්වන **නකනකරක වපි**, **අනුලපි වපි**, **නකොඩපික වපි** (එම. Vol. i: Nos.1129-1130,1132) යන වැව් ද යාන්ඔය නිම්නය ආශ්‍රිත ව පිහිටි වාරි නිර්මාණ විය හැකි ය. කල්පේ කෝරළයේ පිහිටි රස්නකවැව සෙල්ලිපියේ **චුලවිය**, **විහිකවිය වවි**, **මහවිය**, **අලගඩක වවි** නම් වැව් පිළිබඳවත් **වාරක** නම් ඇළ මාර්ගයක් පිළිබඳවත් සඳහන් ව තිබේ (*එම*. Vol. ii: No.153). පහළ තම්මැන්නාව සෙල්ලිපිවල **කබරවිය වවි**, **මතවිය**, යනුවෙන් වාරි නිර්මාණ කිහිපයක් පිළිබඳ ව සඳහන් වේ (එම.: No.155). කල්පේ කෝරළේ කුඹුක්වැව ගිරි ලිපියේ **වටල වවි** යනුවෙන් වැවක් පිළිබඳ ව දැක්වේ (එම.: No.154).

### පුරාණ වැව්

යාන්ඔය නිම්නයේ පැරණි ජන ජීවිතය සරලත්වයේ සිට සංකීර්ණත්වය දක්වා ගොඩනැගී තිබෙන ආකාරය පුරාවිද්‍යාත්මක නටබුන් තුළින් හඳුනාගත හැකි ය. පුරාවිද්‍යාත්මක නටබුන් සහ ඓතිහාසික තොරතුරු අනුව සමාජ, දේශපාලන, ආර්ථික, ආගමික, සංස්කෘතික වශයෙන් සෑම ක්ෂේත්‍රයක් පිළිබඳ ව තොරතුරු අනාවරණයකර ගත හැකි ව තිබේ. සෙල්ලිපි හා පුරාවිද්‍යාත්මක නටබුන් අනුව ප්‍රදේශය තුළ පුළුල් වාරි පද්ධතියක් වර්ධනයකර ඒ ආශ්‍රිත ආදායම් මාර්ග රැසක් බිහිකරගත් බවට එම ආදායමෙන් ප්‍රදේශය ආශ්‍රිත ආගමික විහාරස්ථාන නඩත්තුකල බවට මෙම නිම්නයේ පිහිටි ශිලා ලේඛන ගණනාවකින් ම අනාවරණය වේ. අනුරාධපුර යුගය පුරාවට ම සමෘද්ධිමත් ව පැවති යාන්ඔය නිම්නය වාපි සංස්කෘතිය තුළින් පෝෂණය ලැබූ කලාපයක් විය. ඒ සඳහා ජීවමාන සාධක වන්නේ ද මේ කලාපය පුරා පැතිර තිබෙන විශාල ප්‍රමාණයක්වන ලොකු කුඩා පැරණි වැව් ය.

### හබරණ වැව

යාන්ඔය නිම්නය ආශ්‍රිත ව පිහිටි තරමක විශාල වැවක්වන මෙය පුරාණ නිර්මාණයක් වුවද එහි ආරම්භකයා කුමන පාලකයෙක් ද යන්න නිශ්චිත ව හඳුනාගත නොහැකි ය. අඩි 3940 ක් දිග වැව් බැම්මකින් යුතු මෙහි දායක ප්‍රදේශය වර්ග සැතපුම් 2ක් පමණ වේ.

### හිරිවඩුන්න වැව

වසභ රජු විසින් කරවන ලද **අග්ගිවඩ්ඪමානක වාපි** හෙවත් **අග්ගිවඩමන් වැව** (*එම*.xxxv: 95)යනු යාන්ඔය ඉහත්තාවේ හබරණ ආසන්න ප්‍රදේශයේ පිහිටි **හිරිවඩුන්න වැව** ලෙස හඳුනාගෙන ඇත (Nicholas1963: 173). සෘජුව ම යාන්ඔය හරස්කර ඉදිකර තිබෙන මෙය තරමක විශාල වැවකි. මේවන විට අඹේපුස්ස ත්‍රිකුණාමල මාර්ගය නිසා එම වැව කොටස් දෙකකට වෙන් වී පවතී.

### සීගිරිය මහවැව

මෙම වැව මේවන විට සම්පූර්ණයෙන් ම විනාශ වී තැන තැන වැව් බැම්ම පමණක් ඉතිරි ව තිබේ. මෙම වැව සඳහා ජලය සම්පාදනයකර ඇත්තේ යාන් ඔයෙනි. මෙය ක්‍රිස්තු වර්ෂ 5 වැනි සියවසේ දී පළමු වැනි කාශ්‍යප රජු විසින් සීගිරිය රාජධානිය ගොඩනගන අවස්ථාවේ දී ඊට සමගාමී ව ඉදිකරන ලද වැවක් ලෙස උපකල්පනයකල හැකි ය. සීගිරි බලකොටුවේ දිය අගල්, ජල උද්‍යානය ඇතුළු රාජධානියේ බොහෝ ස්ථාන සඳහා ප්‍රධාන ජල සම්පාදන කටයුතුවලට මූලාශ්‍රය වී ඇත්තේ මෙම වැව ය.

### හොරිවිල වැව

මරදන්කඩවල හබරණ මාර්ගයේ සැතපුම් 9ක් පමණ ගියවිට හමුවන මෙම වැව පැරණි නිර්මාණයකි. මෙය යාන්ඔයේ අතු ගංගාවක්වන හොරිවිලඔය හරස්කොට ඉදිකරන ලද්දකි. මෙම වැව 1952-1954 හා 1957 යන වර්ෂවල දී නැවත ප්‍රතිසංස්කරණයකර ඇත. සැතපුම් 1¾ක දිගකින් යුතු වැව් බැම්මකින් සමන්විත මෙහි වර්ග සැතපුම් 27 ක පමණ ධාරිත ප්‍රදේශයක් පවතී. ජලය අක්කර අඩි 4000ක් පමණ දරාගැනීමේ හැකියාවක් පවතී.

### හුරුළුවැව

යාන්ඔය හරස්කර ඉදිකරන ලද ප්‍රධානතම වාරි නිර්මාණය වන්නේ මහසෙන් (ක්‍රි.ව.276-303) රජු විසින් ඉදිකරන ලද **ජල්ලුරවාපි** යයි (*මව*.

xxxvii: 47). එය වර්තමාන **හුරුලුවැව** ලෙස හඳුනාගෙන තිබේ. ධාතුසේන, පළමු වැනි පරාක්‍රමබාහු ඇතුළු රජවරුන් ගණනාවක් විසින් මෙම වැව පසුකාලීන ව ප්‍රතිසංස්කරණයකර ඇත. මෙහි ධාරිත ප්‍රදේශය වර්ග සැතපුම් 77 කි. වැව් බැම්මේ දිග අඩි 8730 ක් වන අතර අක්කර අඩි 55000 ක ජල ධාරිතාවක් රඳවාගැනීමේ හැකියාව පවතී. මෙම වැව ආශ්‍රිත ව පුරාණ වාරි අවශේෂ තරමක් දුරට ශේෂ ව තිබෙන අතර හුරුළුවැව විහාරය හා දේවාලය හුරුළුවැව ආශ්‍රිත සංස්කෘතික සම්ප්‍රදායයන් තවදුරටත් පවත්වාගෙන එනු ලබයි.

## කිවුල්කඩ වැව

හුරුළුවැවට උතුරින් සැතපුම් 10 ක් පමණ දුරින් පිහිටි කිවුල්කඩවැව පැරණි නිර්මාණයකි. එය හුරුළුවැව ඉදිකරන ලද කාලයට ම අයත් බව විශ්වාස කරයි. පුරාණ සොරොව්වේ අවශේෂ ස්වල්ප වශයෙන් හඳුනාගැනීමේ හැකියාව පවතී. මෙම වැව 1959 දී අලුත්වැඩියාකර ඇත. මෙහි ධාරිත ප්‍රදේශය වර්ග සැතපුම් 11½ ක් වනඅතර වැව් බැම්මේ දිග අඩි 1600 කි. වැවේ සම්පූර්ණ ධාරිතාව අක්කර අඩි 4700 කි.

## දිවුල් වැව

අනුරාධපුර-ත්‍රිකුණාමලය මාර්ගයට උතුරින් හොරොව්පොතානට තරමක් දුරින් පිහිටා තිබෙන මෙම වැව පුරාණ නිර්මාණයක් බවට හඳුනාගත හැකි සාක්ෂි අතර නටබුන් වී ගිය පුරාණ සොරොව්වේ බිසෝකොටුව හඳුනාගැනීමට පුළුවන. වර්ග සැතපුම් 6.8 ක ජල ධාරිතාවයකින් යුතු මෙහි වැව් බැම්ම අඩි 700 කි. අක්කර අඩි 3000 ක ජල ධාරිතාවක් රඳවාගැනීමේ හැකියාව තිබී ඇත.

ඉහත සඳහන් වැව්වලට අමතර ව කුඩා ප්‍රමාණයේ ග්‍රාමීය වැව් ඉතා විශාල සංඛ්‍යාවක් යාන්ඔය නිම්නයේ දක්නට ලැබේ. ඒවා බොහෝමයක් ක්‍රියාත්මක වන්නේ වර්ෂා සමයට පමණක් සක්‍රියවන දියකඳුරු මඟිනි. මෙම වැව් ආශ්‍රිත ව පුරාණ ජනාවාස තිබූ බවට පුරාවිද්‍යාත්මක සාක්ෂි විශාල වශයෙන් හඳුනාගත හැකි ය. මෙම වැව් අතර ***ඉබේයාය වැව, දූටුවැව, මාවතවැව, පුහුදිවලවැව, පඹුරුගස්වැව, කුඹුක්වැව, හාපැටියාවැව, කුඩා හාපැටියාවැව, මහ සොරොව්වවැව, දික්වැව, පුලියන්කුමවැව, බඹරකන්දවැව, කුඩාවැව, වහුකොටුවැව, ඉඳිවැව, තිඹිරිවැව, කරන්ච්වැව, මහාපාලියාවැව, ගඩොල්වැව, වලහවිද්දවැව, රස්නකවැව, වඩිගවැව, කල්පෙවැව, ගලෙන්බිඳුණුවැව, කකුල්බැද්දිගිලියවැව, රිලහාවිද්දවැව, ගම්මගේවැව*** යන වැව් ද ඇතුළු ව තවත් වැව් විශාල සංඛ්‍යාවක් පවතී.

## පුරාණ අමුණු

කිසියම් ජල මාර්ගයක ගලා බසින ජලය අවහිරකර කෘෂිකාර්මික කටයුතු ප්‍රධාන කොටගත් විවිධ කාර්යයන්ට යොමුකර ගැනීම අරමුණුකර ගෙන එම ජල මාර්ගය පමණක් හරස්වන පරිදි වේලි ඉදිකිරීම ලොව පුරාතන වාරි කර්මාන්ත අවධියේ සිට ම පැවති එක් ප්‍රධාන ලක්ෂණයක් විය. තාක්ෂණයෙන් අවම වූ ඉතා කුඩා නිර්මාණයේ සිට තාක්ෂණයෙන් අනූන වූ විශාල ප්‍රමාණයේ නිර්මාණ ලෙසින් ඉදිකරන ලද මෙම වේල්ල දේශීය වශයෙන් හඳුන්වනු ලබන්නේ **'අමුණ'** ලෙසිනි. එ වැනි අමුණු කිහිපයක් ම සාක්ෂි යාන්ඔය ආශ්‍රිත ව දක්නට ලැබේ.

## ඉලුක්වැව අමුණ

උතුරුමැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ ඉලුක්වැව ග්‍රාමය ආශ්‍රිත ව මෙම අමුණ පිහිටා තිබේ. ගලෙන්බිඳුණුවැව කහටගස්දිගිළිය

මාර්ගයේ ඉලුක්වැව ග්‍රාමයේ ප්‍රධාන මාර්ගයේ සිට මීටර් 500 ක් පමණ දුරින් පිහිටා තිබෙන මෙම පුරාණ අමුණ හුරුළුවැවට පහළින් යාන්ඔය හරස්කර ඉදිකරන ලද්දකි. උතුරු අක්ෂාංශ 8° 19' 56.20"හා නැගෙනහිර දේශාංශ 80° 44' 02.35"අතර පිහිටි මෙම ස්ථානයේ උන්නතාංශය මීටර් 104 ක් පමණ වේ.

මෙම අමුණ සම්බන්ධයෙන් මූලාශ්‍රයන් හි තොරතුරු කිසිවක් සඳහන් නොවේ. එහෙත් ජනප්‍රවාදයේ පවතින්නේ මෙම අමුණ හුරුළුවැවට වඩා පැරණි නිර්මාණයක් බව යි. මෙම ස්ථානයේ ම ඉදිකර තිබෙන නව අමුණ නිසා පුරාණ අමුණ සම්පූර්ණයෙන් ම විනාශකර දමා තිබෙන ආකාරය හඳුනාගත හැකි ය. නව අමුණ සඳහා අවශ්‍ය කළුගල් පුරාණ අමුණ කඩාගැනීම මඟින් සපයාගෙන ඇති බව පැහැදිලි ය. වර්තමානයේ මෙම පුරාණ අමුණ සම්බන්ධයෙන් ඉතිරි ව ඇත්තේ ඉතාමත් ම ස්වල්ප වූ සාක්ෂි ප්‍රමාණයක් පමණි. එය නව අමුණට පහළින් ඒ අසල ම යාන්ඔයේ වම් ඉවුර සමීපයේ දක්නට ලැබේ.

ස්වභාවික ගල් ස්තරය පාදම ලෙස යොදාගෙන ඉදිකර තිබුබව පුරාණ අමුණේ දක්නට ලැබෙන සාක්ෂි අනුව උපකල්පනයකල හැක්කේ ස්වභාවික ගල්තලාවේ සිදුරු යොදා සිටුවන ලද සිරස් ගල්කණු මැදිවන සේ අමුණු බැම්ම තිරස් අතට ඉදිකරන්නට ඇති බවයි. අනුරාධපුර යුගය නියෝජනය කෙරෙන ඕවලාකාර හැඩැති විභේදන සිදුරු මෙන් ම පොළොන්නරු යුගය නියෝජනයකරන ආයතාකාර විභේදන සිදුරු ද මෙහි විසිරී තිබෙන ගල් කුට්ටිවල තිබෙන බැවින් රාජධානි අවධි දෙකේ දී ම මෙම අමුණ භාවිතකිරීම කෙරෙහි අවධානය යොමුකර තිබෙන බව පැහැදිලි ය.

කොක්එබේ අමුණ

උතුරුමැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ කහටගස්දිගිලිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයට මායිම් ව පිහිටි මෙම අමුණ උතුරු අක්ෂාංශ 8° 29' 48.38" හා නැගෙනහිර දේශාංශ 80° 49' 36.23" අතරට අයත් වේ. උන්නතාංශය මීටර් 72 පමණ වේ. දාච්චහල්මිල්ලෑව - කැකිරාව මාර්ගයේ ඊතළවැටුණවැව ගම කෙළවරින් ගලා බසින යාන්ඔයේ මෙම පුරාණ අමුණේ සාක්ෂි දක්නට ලැබේ. මෙම අමුණ පිහිටා ඇත්තේ කොකඑබේ කන්දට ඉතාමත් සමීප ස්ථානයකය. මෙම ප්‍රදේශයේ දී යාන්ඔයේ වම් ඉවුර කොක්එබේ වනයට සීමාවී පවතී.

මෙම අමුණ සම්බන්ධයෙන් තොරතුරු කිසිදු මූලාශ්‍රයක සඳහන් නොවේ. එහෙත් මෙම අමුණ සහිත ස්ථානයට ඉතාමත් සමීප කොක්එබේ කන්ද ආශ්‍රිත ව පුරාවිද්‍යාත්මක නටබුන් විශාල ප්‍රමාණයක් දක්නට ලැබේ. ඒ අතර මූල ඓතිහාසික සුසාන භූමියක අවශේෂ ද හඳුනාගත හැකි ය (Seneviratne 1984:249-51). කොක්එබේ කන්ද ආශ්‍රිත ව තිබෙන සෙල්ලිපි ඇසුරින් මෙම ප්‍රදේශය ආශ්‍රිත ව ජනාවාස පිහිටා තිබූ බව සනාථ වේ (*Ic*. Vol. i: No.1146; Vol. ii: No.145). මෙම අමුණේ ඇළ මාර්ගය කොක්එබේ කන්ද පාමුලින් එයට වම් පසින් නටබුන් සහිත ප්‍රදේශයට යොමුවී තිබෙන බැවින් එම ප්‍රදේශයේ ජල සම්පාදන අවශ්‍යතා එ මඟින් සපිරෙන්නට ඇති බව උපකල්පනයකල හැකි ය.

මේවන විට නටබුන් ඉතාමත් ස්වල්පයක් පමණක් දක්නට ලැබෙන මෙම අමුණ ඉදිකර ඇත්තේ යාන්ඔයට තරමක ආනතව ය. මේවන විට අමුණ පිළිබඳ සාක්ෂි හඳුනාගත හැක්කේ යාන්ඔය පතුලේ ස්ථාන කිහිපයක හා එහි වම් ඉවුරේ පමණි. අමුණ රැඳවීමට යෙදූ පාදම්ගල් කිහිපයක් ඔය පතුලේ මුල් ස්වරූපයෙන් තිබෙන ආකාරය

දක්නට ලැබීම නිසා ය. එම ගල්පුවරු රඳවා ඇත්තේ තරමක ආනත ස්වරූපයෙනි. අමුණු බැම්ම යාන්ඔයේ ඉවුරට සම්බන්ධකල බවට සාක්ෂි ස්වල්පයක් වම් ඉවුරේ දක්නට ඇත. ඉවුරේ සිට ඉදිරියට නෙරා ගිය ගල්කුට්ටි කිහිපයක් මෙම ස්ථානයේ දක්නට ලැබේ. දැනට තිබෙන සාක්ෂි අනුව මෙම අමුණ යාන්ඔයේ අනෙකුත් අමුණු හා සසඳන විට එ තරම් විශාල වූවක් නොවන බව පැහැදිලි ය.

පුරාවිද්‍යාත්මක නටබුන් සහිත පුරාණ ජනාවාස බිමකට ඉතාමත් ම සමීපයෙන් පිහිටි අමුණක් ලෙස මෙය සැළකිය හැකි ය. කොක්එබේ කන්ද ආශ්‍රිත ව අවට පිහිටා තිබූ ජනාවාසයේ ජල අවශ්‍යතාවන් සැපිරීම පිණිස මෙම අමුණ ඉදිකරන්නට ඇත.

## විලේවැව අමුණ

උතුරුමැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ හොරොව්පතාන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ විලේවැව ග්‍රාමය කෙළවර මෙම පුරාණ අමුණ පිහිටා ඇත. උතුරු අක්ෂාංශ 8° 30' 24.45" හා නැගෙනහිර දේශාංශ 80° 50' 24.93" අතර තිබෙන මෙහි උන්නතාංශය මීටර් 69 කි. අනුරාධපුර ත්‍රිකුණාමලය මාර්ගයේ නානුම්ල්ලැව හන්දියෙන් දකුණට තිබෙන මාර්ගයේ කිලෝ මීටර් හතරක පමණ දුරකින් පිහිටි විලේවැව ගම කෙළවරින් යාන්ඔයට සමීපවීමෙන් මෙම පුරාණ අමුණෙහි නටබුන් සහිත ස්ථානයට ළඟාවිය හැකි ය.

මෙම ස්ථානය සම්බන්ධයෙන් කිසිදු ඓතිහාසික මූලාශ්‍රයක තොරතුරු සඳහන් නොවේ. එහෙත් මෙම අමුණේ සිට එහි වම් ඉවුරු බද ප්‍රදේශයට ජලය ලබාගත් ව්‍යවහාරයේ යෝධඇළ නම් වූ ඇළ මාර්ගය මගින් ප්‍රදේශයේ වැව් විශාල ප්‍රමාණයට එකවිට ජලය සම්පාදනය කරවූ බව ජනප්‍රවාදයේ දැක්වේ.

ස්වභාවික හා මානව ක්‍රියාකාරකම් හේතුවෙන් විශාල හානියකට පත්වී තිබෙන මෙම පුරාණ අමුණ යාන්ඔයේ උතුරු දකුණු දිශානුගත ව පිහිටා ඇත. මෙම ස්ථානයේ දී යාන්ඔය අමුණ නිසා ඇතිවූ බාධාව හේතුවෙන් එයට දකුණු දෙසින් ගලා බසී. එ බැවින් මෙම පුරාණ අමුණ යාන්ඔයේ වම් ඉවුරට සම්පූර්ණයෙන් ම සම්බන්ධ වී තිබේ. ස්වභාවික ගල්තලාව පාදම්කර ගෙන ගොඩනගන ලද මෙම අමුණ මීටර් 42 ක දිගකින් සහ මීටර් 9.50 ක පමණ පළලකින් යුක්ත වේ. බැම්ම මතුපිට සම්පූර්ණයෙන් ම විනාශ වී තිබෙන බැවින් අමුණු බැම්මේ උස පිළිබඳ ව අදහසක් ලබාගත නො හැකි ය. විවිධ ප්‍රමාණයන්ගෙන් යුක්ත විශාල ගල්කුට්ටි මෙම අමුණ ඉදිකිරීම සඳහා යොදාගෙන තිබේ.

## හබගම අමුණ

උතුරුමැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ හොරොව්පොතාන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ හබගම ග්‍රාමය ආශ්‍රිත ව යාන්ඔයේ පුරාණ අමුණ සම්බන්ධ නටබුන් දක්නට ලැබේ. හොරොව්පොතාන - පරංගියාවාඩිය මාර්ගයේ යාන්ඔය පාළමේ සිට කිලෝ මීටර් තුනක් පමණ ඔය පහළට ගමන්කිරීමේ දී මෙම අමුණ පිළිබඳ සාක්ෂි හමුවේ. උතුරු අක්ෂාංශ 8° 31' 14.91" හා නැගෙනහිර දේශාංශ 80° 51' 34.41" අතර මෙම අමුණ පිහිටා ඇත. උන්නතාංශය මීටර් 64 පමණ වේ.

මෙම ස්ථානය සම්බන්ධයෙන් ඓතිහාසික මූලාශ්‍රයවල තොරතුරු කිසිවක් සඳහන් නොවේ. එසේ වුව ද ජනප්‍රවාදයේ පවතින්නේ මෙම ස්ථානයට සැතපුමක් පමණ දුරින් ඔයේ වම් ඉවුරේ පිහිටා තිබෙන නටබුන් බහුල බ්‍රාහ්මණයාකන්ද නම් ස්ථානයේ පිහිටි මකරයාවිල නමින් හැඳින්වෙන විශාල පොකුණ සඳහා ජලය

සම්පාදනය කිරීමේ පරමාර්ථයෙන් මෙම අමුණ ඉදිකළ බව ය.

අමුණක් පැවති බවට ඉදිරිපත්කල හැකි ප්‍රබලත ම සාක්ෂිය වන්නේ එම ස්ථානයට තරමක් ඉහළින් යාන්ඔයේ වම් හා දකුණු ඉවුරුවලට කපාතිබෙන ඇළ මාර්ගවල අවශේෂයන් ය. මෙම පුරාණ අමුණ ගල්කණු හා හරස් ලෑලි භාවිතකර ඉදිකරන ලද්දක් බව පෙනේ. ඔය හරහට පෙරළී තිබෙන විශාල ගල්කණු සහ ගල්පුවරු රාශියක් දක්නට ලැබේ. ඇතැම් ගල්කණු මීටර් 2.5 ත් මීටර් 3 ත් අතර උසකින් යුක්ත වේ. මෙම ගල්වල කුඩුම්බි හා කප්පිළි ලකුණු තිබෙන ආකාරය ද හඳුනාගත හැකි ය. කුඩුම්බිවල හිරවෙන පරිදි ගල්කණු සිටුවා ඒ අතරට ලෑලි දමා පස් හිරකිරීම මඟින් මෙම අමුණ නිර්මාණය කරන්නට ඇති බව උපකල්පනයකල හැකි ය.

මෙම ස්ථානය ආශ්‍රිත ව පැරණි අමුණක් සමඟ ම ගල්පාලමක් ද පැවති බවට පැහැදිලි සාක්ෂි හඳුනාගැනීමට පුළුවන. මෙම ස්ථානය ආශ්‍රිත ව ඉදිකර තිබුණු මෙම පැරණි ගල්පාලම අනුරාධපුර යුගයේ දී ගෝකන්න වරාය හා අනුරාධපුර නගරය සම්බන්ධකල නැගෙනහිර මාර්ගය හා සම්බන්ධවන අවශේෂ බව උපකල්පනයකල හැකි ය.

## යාන්ඔය අමුණ

උතුරුමැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ හොරොව්පතාන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ හබගම ග්‍රාමයට කිලෝ මීටර් දෙකක් පමණ දුරින් වනාන්තරය ආශ්‍රිත ව මෙම අමුණ පිහිටා ඇත. උතුරු අක්ෂාංශ 8° 33' 32.88" හා නැගෙනහිර දේශාංශ 80° 52' 26.82" අතර පිහිටි මෙහි උන්නතාංශය මීටර් 61 කි. හොරොව්පොතාන - පරංගියාවාඩිය මාර්ගයේ යාන්ඔය පාලමේ සිට කිලෝ මීටර් පහක් පමණ ඔය පහළින් මේ සම්බන්ධ නටබුන් දක්නට ඇත. මෙම ස්ථානයට හොරොව්පොතාන - ත්‍රිකුණාමල මාර්ගයේ යාන්ඔය පාලමේ සිට කිලෝ මීටර හතරක් පමණ ඔයේ ඉහත්තාව දෙසට ගමන්කල විට ද පිවිසිය හැකි ය.

ඓතිහාසික මූලාශ්‍රයවල මෙම අමුණ සම්බන්ධයෙන් තොරතුරු කිසිවක් සඳහන් නොවේ. එසේ වුව ද මෙහි දකුණු ඉවුරු ඇළ මාර්ගය මඟින් විශාල වැව් පද්ධතියකට ජලය සපයා දුන් බව ජනප්‍රවාදයේ සඳහන් ව තිබේ. මෙම වැව් පද්ධතිය නටබුන් ලෙසින් කන්තලේ මහවනය ලෙසින් හැඳින්වෙන මෙම වනාන්තරය ආශ්‍රිත ව මේවන විට ද දක්නට ලැබේ. ඒ ආශ්‍රිත ව විහාරස්ථානයක නටබුන් ද පිහිටා ඇත. එයින් පැහැදිලි වන්නේ පුරාණ ජනාවාස භූමියකට ජලය සැපයීමේ පරමාර්ථයෙන් මෙම අමුණ කරවන්නට ඇති බවයි.

මෙම අමුණ පිළිබඳ ව 1887වර්ෂයේ දී මෙම ප්‍රදේශයේ මිනුම් කටයුතු සිදුකල වික්වෝර් නැමැති මිනින්දෝරු තැන විසින් සිය මැනුම් පිළිබඳ රපෝර්තුවේ මෙලෙස දක්වා ඇත.

> " *කැපුගල්වලින් ද ගෙනාපු ගල්වලින් ද සාදා තිබෙන මෙම අමුණට ගඟ මැද තිබෙන විශාල ගල්පර්වත දෙකක් ආධාර වී ඇත. අමුණ අඩි 132 ක් දිග ය. අඩි 50 ක් පළල ය. ගඟ පතුලේ සිට අඩි 6 ක් උස ය. පුරාණ ඇළ තව ම දක්නට තිබේ. තව ද ගඟ අමුණට වටින් හැරීගොස් තිබෙන නිසා එය පුරාණ ඇළ දිගේ ද ස්වල්ප දුරක් ගමන්කරයි* (Administration Report - 1897) "

වර්තමානයේ මෙම අමුණේ ශේෂ ව තිබෙන කොටස් පරීක්ෂා කිරීමේ දී පැහැදිලි වන්නේ ඉහත සඳහන් මිනුම් වාර්තාවේ තිබෙන තොරතුරු බොහෝ දුරට සත්‍යවන බව ය.

යාන්ඔයේ දකුණු ඉවුරු දෙස සිට විහි දී එන විශාල ගල්තලාවක් ඇසුරුකර ගෙන අමුණ ඉදිකර ඇත. අමුණු බැම්ම නිසා බාධා වූ යාන්ඔයේ ජලය ඔයේ වම් ඉවුර බාදනය කරමින් ගලා බසින ආකාරයට හඳුනාගත හැකි ය. මේ නිසා අමුණු බැම්ම ඉවුරට සම්බන්ධකල ස්ථානය සම්පූර්ණයෙන් ම නිරාවරණය වී පවතී. අමුණු බැම්මේ වම් කොටසින් ශේෂ ව තිබෙන්නේ ඔයේ ඉවුරට ගිල්වූ කොටසයි. වම් ඉවුර බාදනයට ලක්වෙමින් යාන්ඔයේ ජලය ගලාගෙන යාම නිසා මේ කොටස මතුවී තිබේ.

## වාහල්කඩ අමුණ

අනුරාධපුර හා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කවලට මායිම් ව වාහල්කඩ ගොවි ජනපදයේ ඩී 2 කලාපය කෙළවරේ යාන්ඔයේ වම් ඉවුරේ මෙම පුරාණ අමුණ පිහිටා තිබෙන අතර වාහල්කඩ ඩී 2 ජනපදයේ පාසල අසලින් දකුණට තිබෙන මාර්ගයේ කිලෝ මීටර් තුනක් පමණ ගියවිට මෙම ස්ථානයට ලගාවිය හැකි ය. උතුරු අක්ෂාංශ 8°47' 01.37" හා නැගෙනහිර දේශාංශ 80° 53' 02.92" අතර තිබෙන මෙම අමුණ මීටර් 31 ක උසකින් පිහිටා ඇත.

මූලාශ්‍රයගත තොරතුරු මෙම ස්ථානය සම්බන්ධයෙන් හමු නොවේ. එසේ වුව ද පුරාණ අමුණු නිර්මිතයන් පිළිබඳ ව දැනට හඳුනාගත හැකි වඩාත් සුරක්ෂිත ම නිර්මාණයක්වන මේ පිළිබඳ ව 1897 දී **වික්වෝර්** නැමැති මිනින්දෝරු තැන මෙලෙස වාර්තාකර තිබේ.

*" මුල් අමුණට පහළින් පිහිටා තිබෙන මෙය මා විසින් දක්නා ලද පුරාණ විචිත්‍ර කර්මාන්තයන්ගෙන් එකකි. යටකී අමුණේ මෙන් ම මෙහි දී ද ගඟ අමුණට දකුණින් හැරීගොස් තිබේ. මේ නිසා මෙම අමුණේ එක ගලක්වත් ඉවතට පෙරළී නැත. එය සම්පූර්ණයෙන් ම කපාපුගල් ඉතා දක්ෂ ලෙස හේත්තු කිරීමෙන් සාදා ඇත. ගල් පේළියේ පෙළ වරක් ගඟේ වතුර පාරට අනුව ද වරක් ඊට විරුද්ධව ද පිහිටුවා අමුණ බැඳ තිබේ. සමහර ගල් අඩි 11 ½ ක් දිග ය. අඩි 1 ½ පළල ය. අමුණ අඩි 92 ක් දිග ය. අඩි 38 ක් පළල ය. ගඟ පතුලේ සිට අඩි 10 ක් උස ය. අමුණ දෙකෙළවර අඩි 6 උසට ගං ඉවුර අතට හැඩකර සාදා තිබේ. අමුණ උඩින් ගලායන ගංවතුර සීමාකිරීමට මෙසේ සාදන්නට ඇත"*

(Administration Report-1897)

වික්වෝර් මිනින්දෝරු තැන විසින් වර්තාකරන ලද තොරතුරුවලින් විශාල ප්‍රමාණයක් වර්තමානයේ ද මෙම අමුණේ දක්නට ලැබීමෙන් තහවුරු වන්නේ දැඩි විනාශයකට මෙය පසුගිය වසර 200 ක පමණ කාලයක් තුළ ලක් වී නොමැති බව ය. යාන්ඔය පූර්ණ වශයෙන් හරස්වන පරිදි ඉදිකර තිබෙන මෙම අමුණේ සම්පූර්ණ දිග මීටර් 26.80 කි. පළල මීටර් 11.50 කි. මෙය වික්වෝර්ගේ මිනුම්වලට ආසන්න අගයකි. යාන්ඔයේ ප්‍රමාණයට සාපේක්ෂ ව මෙය විශාල අමුණකි. අමුණේ සම්පූර්ණ ප්‍රමාණයෙන් සැලකිය යුතු කොටසක් දැනුදු ආරක්ෂිත ව පවතී. ඔයේ ජලය වැඩි අවස්ථාවල දී අමුණු බැම්ම මතුපිටින් එම ජලය ගලායන විට ඇතිවන සැඩපහරින් ඉවුරු සේදීයාම වැළැක්වීමට යෙදූ ආරක්ෂිත බැම්ම හෙවත් සැඩපහන මෙහි දෙකෙළවර ම දක්නට ඇත. මෙම අමුණේ බැම්මේ මතුපිට ගල් ස්තරයේ 80% ක පමණ ප්‍රතිශතයක් හොඳින් සුරක්ෂිත ව ඇත.

## පුරාණ ඇළ මාර්ග

යාන්ඔයේ අමුණු ආශ්‍රිත ඇළමාර්ගවල ක්‍රියාකාරීත්වය පිළිබඳ ව විමර්ශනය

කිරීමේ දී එක් එක් ස්ථානවල අමුණු ඉදිකිරීමේ පරමාර්ථ පිළිබඳ ව තොරතුරු රැසක් අනාවරණය කර ගැනීමේ හැකියාව පවතී. වර්තමානයේ ප්‍රතිසංස්කරණයකර තිබෙන ඇතැම් පුරාණ අමුණු ආශ්‍රිත ඇළමාර්ග පුරාණ පිහිටීම ආරක්ෂාවන පරිදි යළි ප්‍රතිසංස්කරණයකර ඇති මුත් වර්තමානයේ වැඩි වශයෙන් දක්නට ලැබෙන නව ඉංජිනේරු ක්‍රමවේදයන් අනුව යෙදූ ඇළමාර්ග බැවින් පුරාණ ඇළ මං බොහෝ සෙයින් විනාශවී ගොස් තිබෙන ආකාරය හඳුනාගත හැකි ය. මේවන විට නටබුන් පමණක් ඉතිරිවන පරිදි විනාශවී ගොස් තිබෙන පුරාණ අමුණුවලින් ආරම්භ වූ ඇළමාර්ගවල ස්වල්ප වූ සාක්ෂි පමණක් තැන තැන ඉතිරිකරමින් සම්පූර්ණයෙන් ම විනාශවී ගොස් තිබෙන ආකාරය මෙම අධ්‍යයනයෙන් හඳුනාගත හැකිවිය.

යාන්ඔයේ අමුණු ආශ්‍රිත පුරාණ ඇළමාර්ග පරීක්ෂා කිරීමේ දී හඳුනාගත හැකි ප්‍රධාන ලක්ෂණයක් වන්නේ එම ඇළමාර්ග හැකි උපරිම ආකාරයෙන් පරිසරයට ගැළපෙන ආකාරයට සැළසුම්කර තිබෙන බව ය. අමුණ අසල දී ඇළෙහි ආරම්භය තරමක කෘතිම ස්වරූපයක් දක්නට ලැබුණ ද එය තරමක් දුරට ගමන් කිරීමේ දී ස්වභාවික ජල මාර්ගයක ස්වරූපය පිළිබිඹුකරන බව පැහැදිලි ය. පුරාණ ඇළමාර්ග ප්‍රධාන වශයෙන් සකස්කර ඇත්තේ භූමියේ ස්වාභාවික බෑස්ම හා සමෝච්ඡ පිහිටීම උපයෝගීකර ගෙන බැවින් මෙම ස්වභාවිකත්වය පෙන්නුම්කරන බව පෙනේ. මේ හේතුවෙන් යාන්ඔයේ පුරාණ ඇළමාර්ග වර්තමාන ඇළමාර්ග මෙන් කඳු හෙල් කපා ඍජු ඇළමගක් ලෙස සකස්කර තිබෙන ආකාරයක් දක්නට නොලැබේ.

යාන්ඔය ආශ්‍රිත ව ඉදිකර තිබෙන පුරාණ අමුණු මගින් යාන්ඔයේ අවට ප්‍රදේශය සශ්‍රීක කරලීම පිණිස ජලය තිකුත්කර තිබෙන බවට හඳුනාගත හැකි ය. හුරුළු වැවට පහළින් යාන්ඔයේ ඉදිකර තිබුණු ඉලුක්වැව පුරාණ අමුණ මගින් ප්‍රධාන වශයෙන් ජලය ලබාගෙන ඇත්තේ එහි වම් ඉවුරුබද ප්‍රදේශයට ය. වර්තමාන ඇළමාර්ග යෙදී ඇත්තේ ද ඒ ඔස්සේ ම බව හඳුනාගත හැකි ය. හබගම ප්‍රදේශයේ දී යාන්ඔයේ ඉදිකර තිබෙන අමුණ මගින් ජලය සපයා දී ඇත්තේ ඔයට දකුණු ප්‍රදේශයේ සැතපුමක් පමණ ඈතින් පිහිටි විශාල පොකුණක් සඳහා බව ජන විශ්වාසයේ පවතී. **බ්‍රාහ්මණයාකන්ද** නමින් හැඳින්වෙන නටඹුන් සහිත භූමියක් ආශ්‍රිත ව මෙම පොකුණ පිහිටා තිබෙන අතර එය **මකරයාවිල** ලෙස ව්‍යවහාර වේ.

හොරොව්පොතාන - ත්‍රිකුණාමලය මාර්ගයේ යාන්ඔය පාළමට කි.මී. හතරක් පමණ ඉහළින් පිහිටි පුරාණ අමුණ මගින් ජලය ලබාගෙන ඇත්තේ එහි දකුණු ඉවුර ප්‍රදේශයට ය. අමුණට මීටර් 35 ක් පමණ ඉහළින් ආරම්භවන ඇළමාර්ගය ක්‍රමයෙන් ඔයෙන් ඈත් වෙමින් කන්තලේ වනය තුළට ගමන්කරන ආකාරය හඳුනාගත හැකි ය. මෙම වනාන්තරය තුළ පැරණි ජනාවාස පැවති බවට ඉතාමත් පැහැදිලි සාක්ෂි දක්නට ලැබේ. පැරණි විහාරස්ථාන සම්බන්ධ නටඹුන්, වළං කැබලිති බහුල වශයෙන් විසිරි තිබෙන බිම් ප්‍රදේශ, නටබුන් වී ගිය වැව් මෙයට නිදසුන් ය. මෙම පැරණි අමුණේ පරමාර්ථය වන්නට ඇත්තේ එම ජනාවාස සඳහා අවශ්‍ය කරන දියවර සැපයීම බව පැහැදිලි ය.

විලේවැව ගම කෙළවර යාන්ඔයෙන් හමුවූ පුරාණ අමුණ මගින් වම් ඉවුර ප්‍රදේශයට ජල සම්පාදනයකර තිබේ. එම ඇළ මාර්ගයේ සාක්ෂි දැනුදු දක්නට ලැබෙන අතර ප්‍රදේශවාසීන් අතර ප්‍රසිද්ධ ව ඇත්තේ යෝධඇළ නමිනි. මෙම ඇළමාර්ගය මගින් යාන්ඔයේ වම් ඉවුරේ පිහිටි විශාල ප්‍රමාණයේ වැව් ගණනාවකට ම ජලය ලබා දී ඇත. ඒ අතර **වරා වැව, පොතානේගමවැව, හම්බාරේගමවැව හා මහවැව** ද වේ. මෙම අමුණ ඉදිකිරීමේ මූලික ම

පරමාර්ථය ලෙස හඳුනාගත හැක්කේ හබගම ආසන්නයේ පිහිටි පැරණි ගමක්වන මැකිච්චාවකටුව ප්‍රදේශයේ පිහිටි නටබුන් ව පවතින විශාල වැවකට ජලය සැපයීමය. එය ඉහත සඳහන්කල වැව් සියල්ල අවසානයේ පිහිටා තිබුණු වැවකි.

යාන්ඔය වාහල්කඩට ආසන්න ප්‍රදේශයේ දී හරස්කර ඉදිකරන ලද පුරාණ අමුණ මඟින් ජලය ලබාගෙන ඇත්තේ එහි වම් ඉවුර සඳහා පමණි. එම ඇළමාර්ගයේ සාක්ෂි අමුණු බැම්මට මීටර් 20 ක් පමණ ඉහළින් දක්නට ලැබේ. නමුත් ඇළමාර්ගය පිළිබඳ අදහස් දැක්වීමේ දී වික්වෝර් මිනින්දෝරු තැන පවසන්නේ අමුණට දම්වැල් 14 ක් පමණ ඉහළින් ඔයේ දකුණු ඉවුරේ ඇළමගක් තිබුණු බවත් එය අමුණට දම්වැල් 10 ක් පමණ පහළින් නැවත යාන්ඔයට එකතු වූ බවත් ය. එයට යාකර තිබූ වෙනත් ඇළ මඟක් හමු නොවූ බව දක්වන හෙතෙම ඇතැම් විට එය පස්වලින් ගොඩවී යන්නට ඇතැයි යනුවෙන් ද අදහසක් ලබා දී තිබේ (Administration Report, Survey Department. 1897). නමුත් වික්වෝර්ගේ අදහස සනාථ කිරීමට තරම් ප්‍රමාණවත් සාක්ෂි මෙම අධ්‍යයනය මඟින් හමු නොවීය. ඒ අනුව වික්වෝර් මිනින්දෝරු තැන යාන්ඔයෙන් ම ස්වභාවික ව බාදනය වී නිර්මාණය වූ කොටසක් ඇළමාර්ගය ලෙස අනුමානකල බව සිතිය හැකි වේ. අධ්‍යයනයෙන් හඳුනාගත හැකිවූ ඇළ මාර්ගයෙන් ජලය ලබා දී ඇත්තේ වාහල්කඩ වැවෙන් දියවර සැපයීමට නොහැකි වූ වම් ඉවුරේ වූ විශාල භූමි ප්‍රදේශයකට බව පැහැදිලි ය.

## සංලක්ෂ්‍යය

යාන්ඔය නිම්නය රජරට වියළි කලාපය තුළ බෙහෙවින් සමෘද්ධිමත් ප්‍රදේශයක් ලෙස එහි පැතිරී තිබෙන වාරි නිර්මාණ හා පුරාවිද්‍යාත්මක නටබුන් දෙස බලනවිට පැහැදිලි වේ. මෙම ප්‍රදේශයෙහි කෘෂිකාර්මික කටයුතු සිදුකිරීම සඳහා අතීතයේ පටන් වාරි නිර්මාණ භාවිතය කෙසේ වූවා ද යන්න සොයාබැලීමේ දී පුරාවිද්‍යාත්මක සහ ලිඛිත මූලාශ්‍රයන් මෙන් ම ජන ප්‍රවාදගත තොරතුරු තුළින් රැස්කර ගත් සාක්ෂි මත තීරණයන්ට එළඹීමේ හැකියාව පවතී. ප්‍රාදේශීය ගම්වැව්, විශාල ප්‍රමාණයේ වැව් සහ අමුණු යාන්ඔය නිම්නයේ ගොඩනැගුණු වාරි කර්මාන්තයෝ අතර වේ. විශේෂයෙන් ම වාරි තාක්ෂණය මඟින් කෘෂිකාර්මික කටයුතු සිදුකරමින් ලාංකේය ශිෂ්ටාචාරය ගොඩනැන්වීම සඳහා මෙම නිම්නයෙන් ලැබුණ අනුග්‍රහය සුළු පටු නොවේ. රජරට කලාපයට අයත් යාන්ඔය නිම්නය පුරාණයේ දී අනුරාධපුර රාජධානියේ ප්‍රධාන ග්‍රාමීය ජනාවාස කලාපයක් ව පැවති බව පෙර සඳහන්කල ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක කරුණු මඟින් පැහැදිලි වේ.

යාන්ඔය නිම්නයේ වාපි සංස්කෘතිය කෘෂි කර්මාන්තයට බලපාන ආකාරය පිළිබඳ ව පුරාවිද්‍යාත්මක සාධක ඔස්සේ විමර්ශනාත්මක ව විග්‍රහකර බැලීමේ දී පැහැදිලි වන්නේ මූල ඓතිහාසික සමයේ සිට ම ඒ සඳහා ප්‍රවේශයක් ඇතිවී තිබෙන බවකි. මූල ඓතිහාසික අවධියේ යකඩ තාක්ෂණය හඳුනාගැනීමත් සමග එ තෙක් පැවති සංස්කෘතිය පුළුල් වෙනසකට ලක්විය. එහි ප්‍රතිඵලයක් ලෙස නව ගැමි ජනපද ඇරඹීමත්, කෘෂි කාර්මික කටයුතු පදනම්කර ගෙන නව වාපී සංස්කෘතියක් ඇරඹූ බවටත් සාක්ෂි යාන්ඔය නිම්නය ආශ්‍රිත ව අනාවරණයකර ගැනීමට හැකියාව ලැබිණ. යාන්ඔය නිම්නයේ තිබෙන පුරාණ වාරි නිර්මාණ අනුව පෙනී යන්නේ මෙම නිම්නයේ පවතින ජල හිඟතාව මගහරවා ගැනීම පිණිස මෙම නිම්නයට ම සීමා වූ වැව් අමුණුවලින් යුතු වාරි කර්මාන්ත ජාලයක් ගොඩනගන්නට ඇති බවයි.




වාහල්කඩ අමුණේ මතුපිට සැළසුම




වාහල්කඩ අමුණේ හරස්කඩ පෙනුම





හිරිවඩුන්න වැව



හුරුළු වැව



කිවුලේකඩ වැව



කොක්ඇබේ පුරාණ අමුණ පිහිටි ස්ථානය



විලේවැව පුරාණ අමුණ





වාහල්කඩ පුරාණ අමුණ



ඉලුක්වැව පුරාණ අමුණ



යාන් ඔයේ ඉපැරණි ගල් පාලමක අවශේෂ



යාන් ඔය පුරාණ අමුණ



හබගම පුරාණ අමුණ

## ආශ්‍රිත ග්‍රන්ථ


1. නිකොලස්, සි. ඩබ්., 1979, පුරාතන හා මධ්‍යතන ලංකාවේ ඓතිහාසික ස්ථාන විස්තරය, ***රාජකීය ආසියාතික සමිතියේ ශ්‍රී ලංකා ශාඛාවේ සඟරාව,*** පරිවර්තනය.
2. ***මහාවංසය***, 1967, සංස්. හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි, බටුවන්තුඩාවේ දේවරක්ෂිත පඬිතුමා, කොළඹ, රත්නාකර පොත් වෙළඳ ශාලාව.
3. ***ලංකාවේ ආර්ථික සිතියම් පොත,*** (1969), කොළඹ, සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව.
4. විතානාච්චි, සී. ආර්., 2014, ***පුරාණ ශ්‍රී ලංකාවේ අමුණු නිර්මාණය, භාවිතය සහ තාක්ෂණය පිළිබඳ සමාජ පුරාවිද්‍යාත්මක විමර්ශනයක්,*** දර්ශන විශාරද උපාධි නිබන්ධනය, පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය, කැලණිය විශ්වවිද්‍යාලය (අප්‍රකාශිත).
5. සිරිවීර, ඩබ්. අයි., 2002, ***රජරට ශිෂ්ටාචාරය සහ නිරිත දිග රජධානිය,*** මරදාන, දයාවංශ ජයකොඩි සහ සමාගම.
6. ***Administration Report***,1897 , Administration Report by A.J. Wickwar, Survay Department, Colombo.
7. Arumugam, S., 1969,***Water Resources of Ceylon***, Colombo, Water Resources Board Publication.
8. Brohier, R.L.,1934 (1979), ***Ancient Irrigation Works in Ceylon***. Part i-iii. Colombo, Ministry of Mahaweli Development.
9. Cooray, P.G.,1967 (1984), ***An Introduction to the Geology of Sri Lanka*** (Ceylon), Colombo, National Museums of Sri Lanka.
10. ***Epigraphia Zeylanica vol I.,*** 1912 , London, Oxford University Press.
11. ***Epigraphia Zeylanica vol III .,***1933 , London, Oxford University Press.
12. ***Epigraphia Zeylanica vol IV.,***1944 , London, Oxford University Press.
13. ***Inscription of Ceylon Vol. I. Part. I,II,*** 1970 , Colombo, Department of Archaeology.
14. ***Inscription of Ceylon Vol. II,*** 1983 ,Colombo, Department of Archaeology.
15. Nicholas, C. W.,(1963), Historical topography of Ancient and Medieval Ceylon, ***Journal of the Royal Asiatic Society (NS)***, Vol. vi, Special number, Colombo.

**16.** Senavirathna, S., (1984), The archaeology of the Megalithic-Black and Red Ware complex in Sri Lanka. ***Ancient Ceylon, The journal of the archaeological Department of Sri Lanka***, Colombo, Vol.5: 237-307.

**17.** (1994), The Ecology and Archaeology of the Seruwila: Copper Magnetite prospect North- East Sri Lanka In ***Sri Lanka Journal of Humanities***. Vol xxi (1&2):114-146